# කෑගල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ හා ඒ යටතේ ඇති අනෙකුත් සෞඛ්‍ය ආයතන වල භාවිතය සඳහා ලිපිද්‍රව්‍ය හා පාරිභෝජ්‍ය භාණ්ඩ ලබා ගැනීම සඳහා වන ප්‍රසම්පාදන කොන්දේසි

පහත අවශ්‍යතාවයන් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් ලංසු අයදුම්පත් ඉදිරිපත් කිරීමට සුදුස්සෝ වෙති.

01. (1). ප්‍රසම්පාදන අයදුම්කරුවන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පුරවැසියකු හෝ ලියාපදිංචි සමාගමක්, හවුල් ව්‍යාපාරයක් හෝ තනි පුද්ගල ව්‍යාපාරයක් විය යුතු ය.

(2). ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපත ලංසු ලියවිලි සමග ඉදිරිපත් කල යුතු ය.

02. **ප්‍රසම්පාදන ගාස්තු**

ප්‍රසම්පාදන ආකෘති පත් ලබාගැනීම සඳහා එක් එක් අයිතම කාණ්ඩය වෙනුවෙන් වෙන් වෙන් වශයෙන් රු. 250.00 ක ආපසු නො ගෙවන ගාස්තුවක් කෑගල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත ගෙවා ලබාගත් කුවිතාන්සියක් සියලු ම ලංසු කරුවන් විසින් ඉදිරිපත් කළ යුතු ය.

03. **ලංසු ඇපකරය/ආපසු ගෙවන තැන්පත් මුදල**

ලංසු ඉදිරිපත් කිරීමේ දී සියලුම ලංසු කරුවන් එක් එක් Lot සඳහා ඇමුණුම 01 හි දක්වා ඇති පරිදි මේ සමග අමුණා ඇති ඇමුණුම 02 ආකෘති පත්‍රයට අනුව ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි වාණිජ බැංකුවකින් කෑගල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ නමින් ලබාගත් 2024.09.30 දින දක්වා වලංගු ලංසු ඇපකරයක් හෝ එම මුදල කෑගල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත ගෙවා ලබාගත් ලදුපත ප්‍රසම්පාදන මුල් අයදුම් පිටපතට අමුණා ඉදිරිපත් කළ යුතු ය.

04. **ප්‍රසම්පාදන ආකෘති පත්‍ර නිකුත් කිරීම.**

ප්‍රසම්පාදන ආකෘති පත්‍ර **2024.05.20** දින සිට **2024.06.11** වන දින දක්වා සතියේ වැඩ කරන දිනයන්හි දී **පෙ.ව.09.00** සිට **ප.ව. 2.30 දක්වා** කෑගල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ ගිණුම් අංශය වෙතින් ලබාගත හැකි ය.
මෙහි **ඇමිණුම 01** හි සඳහන් Lot සඳහා වෙන් වෙන් වශයෙන් කෑගල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් නිකුත් කරන **ඇමිණුම 03** ආකෘති පත්‍ර මගින් පමණක් ලංසු ඉදිරිපත් කළ යුතු ය. එම ආකෘති නොවන කිසිම ප්‍රසම්පාදන අයදුම්පතක් භාර ගනු නො ලැබේ.
ලංසු පත්වල සියලු ම මැකීම් හෝ වෙනස් කිරීම්වලට ලංසුකරු විසින් සිය අත්සන තැබිය යුතු ය. මැකීම් හෝ වෙනස් කිරීම් සඳහා මකන දියර භාවිත නො කල යුතු ය.

05. **මිල ගණන් වලංගු කාල සීමාව**

ඔබ විසින් සඳහන් කරනු ලබන මිල ගණන් **2024.09.30** වන දින දක්වා වලංගු විය යුතු ය.

06. **ලංසු කරුවන් අයදුම්පත් එවිය යුතු අන්දම**

එක් එක් Lot සඳහා වෙන් වෙන් වශයෙන් මිල ගනන් ඉදිරිපත් කල යුතු ය. ලංසුකරුවන් විසින් අත්සන් කරන ලද ලංසු අයදුම්පත් පිටපත් දෙකකින් විය යුතු ය. අදාළ සියලු ම සහතික මුල් පිටපත් හා ලංසු ඇපකරය කවරයක බහා මුද්‍රා තබා "මුල් පිටපත" යනුවෙන් සඳහන් කළ යුතු ය. දෙවන පිටපත වෙනත් කවරයක බහා "දෙවන පිටපත" යනුවෙන් සඳහන් කර මෙම පිටපත් දෙක ම තවත් එක් කවරයක බහා මුද්‍රා තබා **"කෑගල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ හා ඒ යටතේ ඇති අනෙකුත් සෞඛ්‍ය ආයතන වල භාවිතය සඳහා ලිපිද්‍රව්‍ය හා පාරිභෝජ්‍ය භාණ්ඩ ලබා ගැනීම" යනුවෙන් කවරයේ වම් පස ඉහළ කෙළවරේ පැහැදිලිව සඳහන් කර 2024.06.12 දින පෙ.ව. 10.30 ට හෝ ඊට පෙර ලැබෙන ලෙස සභාපති, ප්‍රසම්පාදන කමිටුව, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය, කෑගල්ල** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතු ය.

එසේ නැති නම් කෑගල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ ගණකාධිකාරී නිල කාමරයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට ගෙනවිත් බහාලිය හැක.

07. **ලංසු අයදූම්පත් භාර ගැනීම හා විවෘත කිරීම.**

ලංසු පත් භාර ගැනීම අවසන් වූ විගස එනම් 2024.06.12 දින පෙ.ව.10.30 ට කෑගල්ල ප්‍රාදේශීය **සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ නියෝජ්‍ය ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ නිල කාමරයේදී** ලංසු විවෘත කරනු ඇත. ලංසු අයදූම්පත් විවෘත කරන වේලාවේ දී ලංසු කරුවන්ට හෝ ඔහුගේ බලය ලත් නියෝජිතයන්ට පැමිණ සිටිය හැක. නියෝජිතයන් එසේ පැමිණෙන විට ලංසු කරුගේ බලය ලබාගත් ලිපියක් සහ අනන්‍යතාව සනාථ කිරීම සඳහා ජාතික හැඳුනුම්පත් ඉදිරිපත් කළ යුතු ය. එසේ පැමිණෙන ලංසු කරුගේ බලය ලත් නියෝජිතයින් තමාගේ පැමිණීම සනාථ කිරීම සඳහා ලේඛනයක අත්සන් තැබීම කල යුතු ය.

ලංසු අයදූම්පත් විවෘත කරන නිලධාරි විසින් පැමිණ සිටින ලංසු කරුවන්/නියෝජිතයින් ට ඇසෙන සේ ලංසු කරුවන්ගේ නම් සහ ඔවුන්ගේ මිල ගණන් කියවනු ලැබේ.

08. **පූර්ව ලංසු කැදවීමේ රැස්වීම පැවැත්වීම**

පූර්ව ලංසු කැදවීමේ රැස්වීම 2024.06.05 දින පෙ.ව 10.30 ට කෑගල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ නියෝජ්‍ය ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ නිල කාමරයේ දී පැවැත්වේ. ඒ සඳහා ලංසුකරුවන්ට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයන්ට පැමිණිය හැක.

09. **ටෝනර් සහ මුද්‍රණ යන්ත්‍ර රිබන් සඳහා මිල ගණන් ඉදිරිපත් කිරීම**

**ටෝනර් සහ මුද්‍රණ යන්ත්‍ර රිබන් සඳහා මිල ඉදිරිපත් කරන ලංසුකරුවන් Genuine අයිතම සඳහා ලංසු ඉදිරිපත් කල යුතු අතර, තමන් අදාල අයිතමය සඳහා ලංකාවේ බලයලත් අලෙවිකරුවකු බවට ලිඛිත තහවුරුවක් ලංසුපත් සමග ඉදිරිපත් කල යුතුය. අනුමත ලංසුකරු විසින් ටෝනර් සැපයූ පසු එම භාණ්ඩ Genuine බවට නියෝජිත ආයතනය මගින් තහවුරු කරගත් පසු ගෙවීම් කරනු ලැබේ.**

10. **ලංසු ඇගයීම**

ලංසු ඇගයීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි සැලකිල්ල දක්වනු ලැබේ.

i. භාණ්ඩ වල මිල ගනන්
ii. ගුණාත්මක බව
iii. මිල ගනන් කැඳවන එක් එක් අනු අයිතමයන් සඳහා වෙන් වෙන් වශයෙන් ඇගයීම් සිදු කර වෙන් වෙන් වශයෙන් සාරානුකූල ප්‍රතිචාර දක්වනු ලබන ලංසු කරුවන් වෙත ලංසු ප්‍රදානය කිරීම සිදු කරනු ලැබේ.

තෝරා ගන්නා ලංසු කරුවන් විසින් අදාළ භාණ්ඩ මිල දී ගැනීම් ඇණවුමේ සඳහන් නියමිත දිනට පෙර කෑගල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය වෙත ගෙනවිත් බාර දිය යුතු අතර මෙහි ඉහත සඳහන් කර ඇති කොන්දේසි සම්පූර්ණ කර නැති ලංසු පත් ප්‍රතික්ෂේප කරනු ලැබීමට ඉඩ ඇත. සෑම ලංසු පතක් ම භාර ගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ ප්‍රසම්පාදන මණ්ඩලය සතු වේ.

.......................................................

ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ

කෑගල්ල